පිළියන්දල අධ්‍යාපන කලාපය
**Piliyandala Education Zone**

9 ශ්‍රේණිය - දෙවන වාර පරීක්ෂණය 2017 ජුලි **Second Term Test 2017 - Grade 9**

සිංහල භාෂාව හා සාහිත්‍ය

කාලය පැය 2
Two Hours

* ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

* පහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි කොටසේ අදහසට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරන්න.

01) ඔහු <u>කඩිමුඩියේ</u> නුවර යෑමට පිටත් විය.
i) සිතාමතා ii) හදිසියෙන්ම
iii) සිත් අමනාපයෙන් iv) බැතියෙන්

02) ඔහු <u>ආවට ගියාට</u> වැඩ කරන කෙනෙකු නොවේ.
i) පැමිණි විගස ii) කම්මැලිව
iii) සිත් අමනාපයෙන් iv) නොකර බැරි නිසා

03) නපුරු බල්ලා ඉදිරියට එනු දුටු ඔහුට <u>හීන්දාඩිය</u> දමමින් තිබිණ
i) ඉහින් කනින් දාඩිය දැමීම ii) අධික ලෙස බියට පත්වීම
iii) සුළුවෙන් තැති ගැන්මකට ලක් වීම iv) සිහින් දාඩිය විශේෂයක් වෑහීම

04) අක්ෂර වින්‍යාසය නිවැරදි ව යෙදී ඇති පද පේළිය තෝරන්න.
i) විශ්මය, පුස්තකාලය, ශ්‍රේෂ්ට, ප්‍රදර්ශනය
ii) විශ්ලේසණය, ශ්‍රවණාගාරය, පර්යේෂණ, ආකර්සන
iii) නිෂ්කලංක, නිශ්ශබ්ද, සංගායණාව, ප්‍රත්‍යක්ස
iv) සමස්ත, ආශ්චර්යය, ශිෂ්ටාචාරය, උත්කර්ෂ

05) අකාරාදිය පිළිවෙළට යෙදී ඇති පේළිය තෝරන්න.
i) අනුරාධපුරය, ඔක්කම්පිටිය, කළුතර, ගාල්ල
ii) නුවර, කොළඹ, කෑගල්ල, ගම්පහ
iii) කෝට්ටෙ, සීතාවක, කතරගම, මාතර
iv) යාපනය, අනුරාධපුරය, කෑගල්ල, ගම්පහ

* හිස් තැනට වඩාත් සුදුසු පදය තෝරන්න.

06) දෙමව්පියන්ගේ එකම ...................................... තම දරුවන්ගේ දියුණුව දැකීමයි.
i) පරීක්ෂාව ii) උපේක්ෂාව iii) ආරක්ෂාව iv) අපේක්ෂාව

07) ආතර් සී ක්ලාක් විශ්ව ................................... ට යොමු වූයේ කුඩා අවධියේ සිටය.
i) ගවේෂණය ii) නිරීක්ෂණය iii) පරීක්ෂණය iv) පර්යේෂණය

08) මුලින් දී ඇති වචනයට සමාන පදය ඇතුළත් පිළිතුර තෝරන්න.
i) මුහුද - මහද්වීපය ii) දිවයුරු - දිනිඳු
iii) මුහුණ - සිසි iv) ව්‍යසනය - පුදුමය

09) මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථයක් නො දෙන පිළිතුර තෝරන්න.
i) අහංකාර - නිරහංකාර ii) ආත්මාර්ථකාමී - පරාර්ථකාමී
iii) ජයග්‍රහණය - විජයග්‍රහණය iv) දීප්තිමත් - අන්ධකාරය

10) කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා, මිශ්‍ර ක්‍රියා, අනියමාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා, ප්‍රයෝජ්‍ය ක්‍රියා අනුපිළිවෙළින් යෙදී ඇති පද පේළිය තෝරන්න.
i) වැස්සොත්, නටද්දී, කඩවයි, ලියමින්
ii) නටද්දී, ලියමින්, වැස්සොත්, කඩවයි
iii) කඩවයි, වැස්සොත්, ලියමින්, නටද්දී
iv) නටද්දී, කඩවයි, ලියමින්, වැස්සොත්

11) උපසර්ග පදයක් යෙදී නැති වරණය තෝරන්න.
i) පියා තම පුතුට අවවාද කළේ ය.
ii) ඔහුගේ ජයග්‍රහණය ගැන ඇසූ මම ඉමහත් සතුටට පත් වීමි.
iii) දූදනෝ අපකීර්තියට පත් වෙති.
iv) මව සෙනෙහසින් දරුවන් රකියි.

12) මුලින් දැක්වෙන ව්‍යාකරණ විධියට අයත් නොවන උදාහරණයක් දී ඇති වරණය තෝරන්න.
i) ඛේදාර්ථය නිපාත - අනේ, අහෝ, අයියෝ, අපෝ
ii) කාලාර්ථය නිපාත - දැන්, යළි, නිතොර, නැවත
iii) විකල්පාර්ථය නිපාත - තෙක්, දක්වා, තුරු, පටන්
iv) උපමාර්ථයේ නිපාත - මෙන්, සේ, වැනි, බඳු

13) මුලින් දී ඇති අදහස දීමට ඉතාම සුදුසු ප්‍රස්තාව පිරුළ තෝරන්න.
* ලැබුණේ නොසිතූ අන්දමේ ප්‍රතිඵලයකි.
i) ඉත්තෑවගේ ගෙට කැබැල්ලෑව වැදුණා වාගේ.
ii) විද්දේ හාවටයි වැදුණේ පඳුරට.
iii) ගිය ලුලා මහ එකාලු.
iv) අටුවෙන් දුමට බැස්ස වගේ.

* එක් එක් යෙදුම වෙනුවට යෙදිය හැකි තනි වචනය තෝරන්න.

14) වචනයෙන් කියවෙන අර්ථය ඉක්මවා මතුවන අර්ථ
i) පුණරුක්තිය　　ii) මාධූර්යය　　iii) අර්ථ පූර්ණ　　iv) ව්‍යංග්‍යාර්ථ

15) හැඟීම් වලින් පිරුණු
i) අර්ථ මාධූර්ය　　ii) ඖචිත්‍ය　　iii) භාව පූර්ණ　　iv) සුසංයෝජනය

16) පහත සඳහන් පදවල අර්ථය පිළිවෙළින් යෙදුණු පද පේළිය වන්නේ,
නිරුක්තිය, අත්වාසිය, කෙම් පහන්, අත්තම
i) විස්තරාර්ථ, වාසනාව, කෙම්කිරීම, අත් උදව්ව.
ii) වාසනාව, කෙම්කිරීම, අත් උදව්ව, විස්තරාර්ථ.
iii) කෙම්කිරීම, අත් උදව්ව, විස්තරාර්ථ වාසනාව
iv) විස්තරාර්ථ, වාසනාව, අත් උදව්ව, කෙම්කිරීම

17) පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
i) අප්‍රාණවාචී බහු වචන පදයක් උක්ත වූ විට ආඛ්‍යාතය ඒක වචන වේ.
ii) නිත්‍ය බහුවචන තුළින් ඒකාර්ථයක් ප්‍රකාශ වේ නම් එහිදී ආඛ්‍යාතය බහුවචනයෙන් තබයි.
iii) අයෙක්, ඇතමෙක් වැනි නිත්‍ය බහු වචන පදයක් උක්ත වූ කල්හි ආඛ්‍යාතය ඒකවචන වේ.
iv) ගෞරවාර්ථය සඳහා ආණ, අණි යන ප්‍රත්‍ය යෙදුණු විට. ආඛ්‍යාතය ඒක වචන වේ.

* 18,19,20 යන ප්‍රශ්නවල ව්‍යාකරණානුකූල නිවැරදි වාක්‍ය තෝරන්න.

18) i) සුදු වලාවෝ අහසේ පාවෙයි.
ii) තරු අහසේ දීප්තිමත්ව බබලති.
iii) කර්මාන්තශාලා සමූහය රටේ සංවර්ධනයට දායක වෙති.
iv) ගංගාවෝ මුහුදට ගලා බසිති.

19) i) පියාණෝ සෙනෙහසින් දරුවෝ රකිති.
ii) පුතණුවෝ මැනවින් ශිල්ප හදාරති.
iii) අම්මා මම කැදෙවුවාය.
iv) කුරුල්ලෝ අහසේ එහා මෙහා පියාසර කරයි.

20) i) ඇතමෙක් ගී ගයමින් නටයි.
ii) මැණියන් දැ ඔවදන් දෙයි.
iii) පන්තියෙන් එක් කෙනෙක් නැගිට යයි.
iv) සරත්චන්ද්‍රයෝ මනමේ නාට්‍ය ලිව්වේය.

---

## II කොටස

* 01, 02 හා 03 ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01) දෙවන වාරය සඳහා ඔබට නියමිත ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන ඇසුරින් පිළිතුරු ලියන්න.

1) ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන ඇරඹීමට පෙර ලැබුණු ගුරු උපදෙස් දෙකක් ලියන්න. (ල. 02)

2) ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන සඳහා ඔබ නිර්මාණය කළ ප්‍රශ්න 2ක් ලියන්න. (ල. 04)

3) ප්‍රශ්න සකස් කිරීමේදී ඔබ මුහුණ පෑ ගැටලු 2ක් ලියන්න. (ල. 02)

4) ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහනට ඔබ දායක වූ ආකාරය කෙටියෙන් විස්තර කරන්න. (ල. 04)

5) එම සාමුහික ක්‍රියාකාරකමෙහි නිරත වීම තුළින් ඔබට ලැබුණු ප්‍රයෝජන 02ක් ලියන්න. (ල. 04)
(මුළු ලකුණු 16)

02) පහත දැක්වෙන තේමා අතරින් එකක් තෝරා ගෙන වචන 200කට නොඅඩු රචනාවක් ලියන්න.

1) සන්නිවේදන තාක්ෂණය නිසා ලොවට සැලසුණු සෙත.

2) වැඩිහිටියන් ආදරයෙන් රැක බලා ගනිමු.

3) යහපත් සාරධර්ම තුළින් යහපත් සමාජයක්

4) පරිසරය සුරකිමු. (ල. 14)

03) ඔබගේ පාසලේ විවාද කණ්ඩායම සහ වෙනත් පාසලක විවාද කණ්ඩායම අතර පැවැත්වෙන විවාද තරඟය නැරඹීමට පැමිණෙන ලෙස දන්වා, ඔබේ ප්‍රදේශයේ පාසල් වලට යැවීම සඳහා ආරාධනා පත්‍රයක් සකස් කරන්න. (ල. )

04) පහත සඳහන් ප්‍රකාශ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

1) '' තමන්ගේ බත උයා පිහාගෙන කෑම මදිකමක්වත්, අවනම්බුවක්වත් නොවෙයි.''

i) මෙම ප්‍රකාශය කළේ කවුරුන් විසින්ද?
ii) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩම උපුටා ගත් මුල් කෘතිය කුමක්ද?

2) ''මෙහි නොසිට දුන් ම යනු, මා කී ලෙසින් බලපොකුණ මැනවින් රකිනු''
i) මේ ප්‍රකාශය කළේ කා හට ද?
ii) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක් ද?

3) ''රුක් අත්තන මල මුදුනේ'' යන ගීතයේ

i) ගී පද රචනය කළේ කවුරුන් ද?

ii) ගීතය ගායනා කරන්නේ කවරෙක්ද?

4) ''තාත්තට දූන් විවේකෙන් ඉන්න පුළුවන්. වයසට යනකොට විවේකය ඕනෑමයි.

i) මෙම ප්‍රකාශය ඇතුළත් පාඩමේ නම කුමක්ද?

ii) මෙම කෙටිකතාවේ කතුවරයාගේ නම කුමක්ද?

5) ''ඔය ටිකා සී පද කියන ඒවා හදපු කෙනෙක් නෑ, ඕවා ආවේ කටින් කට''

i) මෙම ප්‍රකාශය කළේ කවුරුන් විසින් ද?

ii) මෙම ප්‍රකාශය කළේ කවුරුන් හට ද? (ලකුණු 2X5=10)

05) දිලිහෙන ගඟු ලැලී ය ඇද හැලීය
ගිලිමල් රොන වුලීය සුදු වැලීය
..............................................................................
..............................................................................

i) ඉහත කවියේ ඉතිරි පද්‍ය පාද දෙක ලියන්න.

ii) මෙම පද්‍ය ඇතුළත් පාඩම නම් කරන්න.

iii) එම පාඩම ඇතුළත් සාහිත්‍ය නිර්මාණය කුමක් ද?

iv) එය අයත් සාහිත්‍ය යුගය නම් කරන්න.

v) ''ගිලිහුණා වූ මල් රේණුයෙන්'' යන අර්ථය දක්වෙන කාව්‍ය කොටස ලියන්න. (ලකුණු 2X5=10)

06) පෙළ පොත ඇසුරින් පිළිතුරු සපයන්න.

1) ''කුරුළු පාළුව'' පාඩම සැකසී ඇත්තේ කුමන ප්‍රදේශයක කතා බහ ඇසුරින් ද?

2) කුරුළු පාළුව යනුවෙන් හඳුන්වන්නේ කුමක්ද?

3) වී ගොවිතැන් සංස්කෘතියේ භාවිත කෙරෙන

i) කටුපන

ii) යතුර යන පද වලින් හඳුන්වන්නේ මොනවාද?

4) විජයබා කොල්ලය රචනා කරන ලද කතුවරයා කවරෙක්ද?

5) ''මව්සෙනේ'' නම් නාට්‍ය නිර්මාණය කරන ලද්දේ කුමන ජාතක කතාවක් ඇසුරින්ද?

(ලකුණු 2X5=10)

07) පහත ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු ලියන්න.

ගැයීම්, වැයීම්, නැටීම යන අවයව තුනකින් සංගිතය සමන්විත වේ. මේ සංගීතය, නැමැති ආයුධය මනුෂ්‍යයන්ගේ ඇතැම් ඉන්ද්‍රයන්හි දළ ගතිය නැති කොට, ඒවා සිලුටු කරන්නට ශක්තියක් ඇති එකක් බව දන් ප්‍රත්‍යක්ෂ වී තිබේ. සංගීතකාරයකු වන පරමාර්ථයෙන් ම නො වුවත් සංගීතය දැනීමෙන් නොයක් ප්‍රයෝජන තිබේ. සංගීතය විඥානය දියුණු කරයි. සංගීතයෙන් චක්ෂුරාදි ඉන්ද්‍රියන්ගේ ජීව ශක්තිය දියුණු වන්නේ ය. ඒ හේතු කොට ගෙන ඒවායේ සිලිටු බව ද ඇති වන්නේ ය. එපමණක් නොව සංගීතය හිතේ හඩිසි කැළඹීම් පාලනය කරන්නට ද සමර්ථය. මෙසේ සලකන විට සංගීතය නිසා විනීත වූ ශිෂ්ටාචාරත්වය ලොවෙහි වැඩෙන පැතිරෙන බව ප්‍රත්‍යක්ෂ ය.

පෙරදිග සංගීතය යි නාම තබමින් දන් ලංකාවාසීන් ජාතික සංගීතයක් හැටියට භාවිතා කරන්නේ ඉංදියාවටවත්, මෙරටටවත් නො ගැළපෙන සේ දූෂණය කර ගත් පහත් පෙළේ සංගීත ක්‍රමයෙකි.

i) සංගීතය සමන්විත වී තිබෙන්නේ කවර අංගයන්ගෙන්ද?

ii) සංගීතය උපමා කර ඇත්තේ කුමකටද?

iii) සංගීතයේ ශක්තියෙන් කුමක් සිදු වේද?

iv) සංගීතය ඉගෙනීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

v) ඡේදයට අනුව පෙරදිග සංගීතය පැහැදලි කර ඇත්තේ කෙසේද?